**සීතාවක ප්‍රාදේශීය සභාව - 2020**

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති** | | |
| (අ) ප්‍රමිතයේ 3.9 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු, එනම් මුල් අයවැය, අවසාන අයවැය සහ ඒ අතර ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | ප්‍රමිත හා ගැසට් නිවේදනය පරිදි ගිණුම සකස් කිරීමට කටයුතු කළත් එහි ඇතුළත් සියළු හෙළිදරව් කිරීම් කිරීමට තරම් දැනුවත් කිරීමක් සිදු වී නොතිබුණ අතර ඉදිරියේදී මේ සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි සියලු දේපළ පිරියත හා උපකරණ ලේඛනගත කල යුතු වේ. |
| (ආ) ප්‍රමිතයේ 6.3 වගන්තිය ප්‍රකාරව සභාව සතු ස්ථාවර වත්කම් සියල්ලම දේපළ, පිරියත හා උපකරණ යටතේ හෙළිදරව් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. තවද, මංමාවත්, බෝක්කු හා පාලම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු ස්ථාවර වත්කම් සියල්ල දේපළ, පිරියත හා උපකරණ යටතේ හෙළිදරව් කිරීම සඳහාත් මංමාවත්, බෝක්කු හා පාලම් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කිරීම සඳහාත් ගිණුම සකස් කිරීමට ප්‍රථම අදාළ | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | තොරතුරු ලබා දීමට ප්‍රමාණවත් කාලයක් නොවුයෙන් අවසන් කිරීමට නොහැකි විය. | |
| (ඇ) ප්‍රමිතයේ 6.14 (ආ) වගන්තිය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජ්‍ය ජීව කාලය නිර්ණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් වත්කම අක්‍රීයව පවත්නා විට කරන ලද සත්කාරය සහ නඩත්තුව වැනි මෙහෙයුම් සාධක ද සැලකිල්ලට ගතයුතු වුවත් එම කරුණු සැලකිල්ලට ගෙන නොතිබුණි. | RA 7616 ට්‍රැක්ටරය හා SL 7792 දරණ ට්‍රැක්ටරය අපහරණය කිරීමට නියමිතව තිබූ බැවින් ප්‍රයෝජ්‍ය ජීව කාලය නිර්ණය කිරීමක් සිදු වී නොමැත. ඉදිරියේදී මූල්‍ය රීති අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) ප්‍රමිතයේ 9.8 වගන්තිය ප්‍රකාරව රජයෙන් වන පැවරුම්, පුස්තකාල හා ඖෂධ ආධාර ආදිය ලැබුණු හෝ ලැබිය යුතු කාල පරිච්ඡේදයේ අයභාර ලෙස හඳුනාගෙන නොතිබුණි. | නිශ්චිතව ලැබෙන කාලයක් පෙර දැනුවත් නොකිරීම හා වර්ෂය අවසානයේ ලැබුණු විට ගිණුම්වලට ඇතුළත් කිරීමේ කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති නිසා ණයහිමි යටතේ තබාගෙන ඉදිරි වර්ෂයේ අදාළ පැවරුම් සම්බන්ධව කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) ප්‍රමිතයේ 9.9 වගන්තිය ප්‍රකාරව වෙනත් විස්තිරණ ආදායම් තුළ ඇති අයභාරවල තෘප්ත නොකරන රජයෙන් වන පැවරුම් ස්කන්ධයේ වෙනම සංරචක ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ රු.18,460,134 ක් ලෙස දැක්වුවද එම වටිනාකම හඳුනාගත් ආකාරය හෙළිදරව් කර නොතිබුණි. | රු.18,460,134 දක්වා ඇති අගය මෙම සටහන තැබීම පිළිබඳ දැනුවත්ව නොසිටි බැවින් වැරදි ලෙස සටහන්කර ඇති අතර එය නිවැරදි කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) ප්‍රමිතයේ 11.9 වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සඳහා වන ප්‍රතිපාදන සම්බන්ධයෙන් කාල පරිච්ඡේදය ආරම්භයේදී සහ අවසානයේදී ධාරණ අගය කාල පරිච්ඡේදය තුළදී එකතු කිරීම් සහ අඩුකිරීම්, ප්‍රයෝජනයට නොගත් වටිනාකම් ආදිය පිළිබඳ සංසන්දනයක් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී මෙම හෙළිදරව් කිරීම් සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව ලබාදෙන උපදෙස් පරිදි කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රාග්ධන ප්‍රදාන රු.105,088,590 ක් ගිණුම්ගත කරනවා වෙනුවට රු.123,548,724 ක් ගිණුම්ගත කර තිබුණි. | විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ අදාළ සංශෝධන සිදු කර පිටපතක් ඉදිරිපත් කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ)විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ලෙස රු.10,508,859 ක් වෙනුවට මුළු ප්‍රාග්ධන ප්‍රදාන රු.105,088,590 ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.94,579,731 ක් වැඩියෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කර තිබුණි. | විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ අදාළ සංශෝධන සිදු කර පිටපතක් ඉදිරිපත් කරමි. | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රු.94,579,731ක් ගිණුම්ගත කරනවා වෙනුවට රු.18,460,134 ක් ගිණුම්වල දැක්වීම හේතුවෙන් රු.76,119,597 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් වගකීම් ප්‍රකාශනයේ අදාළ සංශෝධන සිදු කර අඩුවීම ගලපන ලදී. | |
| (ඈ)ජර්නල් 55 මගින් සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් රු.15,632,758ක් ගිණුම්ගත කිරීමේදී කෙරීගෙන යන වැඩ වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුමේ ගලපා වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඉ) පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත -2017 වලට අනුව මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ අවසාන ගිණුමේ මේ සම්බන්ධව නිවැරදිව ඉදිරිපත් කරමි. | |
| (ඊ) කම්පැක්ටර් රථය වෙනුවෙන් ගෙවියයුතු ණය වාරික මුදල වූ රු.1,084,000 ක් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබිය යුතු දෑ ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ මේ සම්බන්ධව නව ගිණුම් ක්‍රමයට අනුව අදාළ අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරමි. | |

| | | |
|---|---|---|
| (උ) 2020 දෙසැම්බර් 31 දිනට සභාව සතු රු.2,352,400 ක් වූ දේපළ, පිරියත හා උපකරණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | |
| (ඌ) සවිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.1,611,495 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ රු.1,208,621 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.402,874 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (එ) වත්කම් මිලදී ගන්නා වර්ෂයේ ක්ෂය නොකරන බව ගිණුම් ප්‍රතිපත්තියේ දැක්වුවද සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පුස්තකාල පොත් රු.2,893,073 ක් සඳහා ක්ෂය කිරීම හේතුවෙන් පුස්තකාල පොත් රු.289,307 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ |
| (ඒ) සභා බලප්‍රදේශයේ ඇති තුන්නාන පොදු සුසාන භූමියේ ආදාහනාගාරයේ 2019 වර්ෂයේදී රු.21,589,738 ක් වියදම් කර ගොඩනැගිල්ලේ වැඩ නිම කර ඇතත් එය ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මෙම දේපළ සභාවට පවරා ගැනීමෙන් පසුව ගොඩනැගිලි උප ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | |
| (ඔ) පෙර වර්ෂවලට අදාළ මංමාවත්, බෝක්කු හා පාලම් සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ රු.8,688,785 ක් වටිනා මංමාවත් බෝක්කු හා පාලම් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |

| | | |
|---|---|---|
| (ඕ) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ |
| (i) සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂයවීම් රු.12,194,401ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |
| (ii) සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම රු.28,151,170ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.393,663,485 ක සෘණ අගයක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රු.365,512,314 ක් ලෙස ඇතුළත් කර තිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |
| (iii) මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය තුළ ඇති ප්‍රාග්ධන ලැබීම් යටතේ සේවා ගාස්තු සඳහා ලැබුණු රු.122,000 ක් ඇතුළත් වී තිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |
| (iv) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ තුළ රු.24,858,075 ක් වටිනා පෙර ගෙවීම් හා අත්තිකාරම් අඩුවීම ඇතුළත් කර නොතිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |
| (v) ලැබුණු පොළී ආදායම රු.6,497,248 ක් ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඇතුළත් විය යුතු වුවත් සභාව විසින් සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද ආදායම් ලෙස අතිරික්තයට ඇතුළත් වී තිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |
| (vi) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය තුළ ජංගම වත්කම් හා ජංගම වගකීම් අඩුවීම හා වැඩිවීම වෙන වෙනම දැක්විය යුතු වුවත් සභාව විසින් එසේ සිදුකර නොතිබුණි. | නව ගිණුම් ක්‍රමයක් බැවින් මේ පිළිබඳ මහ හැරීම් සිදුවී ඇති බව පිළිගනිමි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 30,356,058 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.94,876,737 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **වරිපනම් හා බදු** | | |
| (අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.12,548,776 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ පැවති කොරෝනා වෛරසය ව්‍යාප්තිය හේතුවෙන් රජය විසින් සහන සැලසීම හා මුදල් එකතු කිරීම සඳහා නිවසින් නිවසට යාම සෞඛ්‍ය නීති රීතිවලට අනුකූලව සිදු කිරීමට සිදු වීම හේතු කොටගෙන හිඟ ආදායම් අය කර ගැනීම සඳහා දේපළ තහනම් කටයුතුවල නොයෙදුනු බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ අක්කර බදු ශේෂය රු.67,454 ක් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂ අය කර ගැනීම සඳහා ලිපි මඟින් දැනුම් දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. |
| **(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.49,000,000 ක් හා මුද්දර ගාස්තු රු.196,125,951 ක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනම මත ගිණුම් තැබීම සිදු කරයි. ඒ අනුව ලැබුණා හෝ නොලැබුණා වර්ෂයට අදාළ ලැබිය යුතු බවට අයවැය ලේඛනයේ ඇස්තමේන්තු කළ මුදල අදාළ වර්ෂය වෙනුවෙන් හිඟ හිටි මුදලට එකතු කරමින් ගණනය කිරීම් කරයි. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. |